ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය

**කොළඹ**

<u>**පුවත්පත් නිවේදනය**</u>

<u>**වතු කම්කරුවන්ගේ දරුවන්ගෙන් CEWET ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවේ**</u>

ලංකා වතු කම්කරුවන්ගේ අධ්‍යාපන භාරය **(CEWET)** විසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා වතු කම්කරුවන්ගේ දරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ශිෂ්‍යත්ව අ.පො.ස උසස් පෙළ, උපාධි පාඨමාලා සහ ශ්‍රී ලංකාවේ වෙනත් රජයේ තාක්ෂණික විද්‍යාලවල වෘත්තීය/තාක්ෂණික අධ්‍යාපනය ලබන සිසුන් සඳහා පිරිනමනු ලැබේ.

2. අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් (අවම වශයෙන් සම්මාන සාමාර්ථ 6 ක් සහිතව) හෝ උසස් පෙළ සමත් වයස අවුරුදු 25 ට අඩු පුද්ගලයන්ට මෙම ශිෂ්‍යත්වය සඳහා අයදුම් කල හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ ශිෂ්‍යයාගේ උප්පැන්න සහතිකයේ, අ.පො.ස සාමාන්‍ය පෙළ හෝ අ.පො.ස. උසස් පෙළ ප්‍රතිපල පත්‍රයේ, දෙමාපියන්ගේ රැකියාව පිළිබඳ වතු අධිකාරිගේ සහතිකයේ, දෙමව්පියන්ගේ වඩාත්ම මෑත කාලීන වැටුප් පත්‍රයේ සහ අයදුම්කරුගේ වඩාත්ම මෑත කාලීන බැංකු පොතේ පළමු පිටුවේ ඡායා පිටපත් එවිය යුතුය. අයදුම්පත් කොළඹ, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ www.hcicolombo.gov.in යන වෙබ් අඩවියෙන් බාගත හැකිය.

3. එසේම අයදුම්පත් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, 36-38, ගාලු පාර, කොළඹ-03 සහ සහකාර ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය, අංක 42, හිල්පන්කඳුර මාවත, අම්පිටිය පාර, මහනුවර යන ලිපිනයන්ගෙන් ද ලබා ගත හැකිය.

4. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ගරු ලේකම්, ලංකා වතු කම්කරුවන්ගේ අධ්‍යාපන භාරය, ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය භාරයේ, තැපැල් පෙට්ටිය 882, ගාලු පාර, කොළඹ-03 යන ලිපිනයට 2026 අප්‍රේල් 28 දිනට හෝ ඊට පෙර ලැබීමට සලස්වන්න.

****

***කොළඹ***

***2026*** මාර්තු ***27***